Department of Education,Sabaragamuwa Province/ Weekly School

# Chords - කෝඩ්ස් ගොඩනගමු

- Chords බටහිර සංගීතයේ එන සංකල්පයකි.
- නූතන සරළ සංගීතයේ කෝඩ්ස් බහුලව භාවිතා වේ.
- එකිනෙකට Harmony ( හාර්මනි ) වන සුසංගත වන ගැලපෙන සවර කිහිපයක එකතුවක් Chord එකකි.
- මූලික වශයෙන් Chord වර්ග දෙකකි
  - Major - මේජර් කෝඩ් හා
  - Minor - මයිනර් කෝඩ් වේ
- මීට අමතරව Augmented Diminish 7th වශයෙන් කෝඩ්ස් වර්ග ගණනාවක් ඇත.
- කෝඩ් එකක් සඳහා අවම වශයෙන් ස්වර 3ක් අවශ්‍යය. ස්වර 3ක් සහිත කෝඩ් එකක් Tried කෝඩ් එකක් නමින් හැදින්වේ.

## Major කෝඩ් එකක් ගොඩනගමු

ඕනෑම ස්වරයකින් පටන්ගෙන පිළිවෙලට ස්වර 8ක් ලියන්න.

ස්වර 8ක් ලියන පිළිවෙල මෙසේය
සංගීතයේ යෙදෙන ස්වර 12 යෙදෙන පිළිවෙලට අනුව විය යුතුය.

| | (1) | 2 | 3 | 4 | (5) | 6 | 7 | (8) |
|---|---|---|---|---|---|---|---|---|
| ස ස්වරය මුල්කරගෙන - | ස | රි (underlined) | රි | ග (underlined) | ග | ම | ම | ප |
| | C | C” | D | D” | E | F | F” | G |

| | (1) | 2 | 3 | 4 | (5) | 6 | 7 | (8) |
|---|---|---|---|---|---|---|---|---|
| ම ස්වරය මුල්කරගෙන - | ම | ම’ | ප | ධ (underlined) | ධ | නි (underlined) | නි | ස |
| | F | F” | G | G” | A | A” | B | C |

මෙම ස්වර 8න් 1 ස්වරයත්, 5 ස්වරයත්, 8 ස්වරයත් (1,5,8) ලබා ගැනීමෙන් Major chord එකක් ගොඩනැගේ.
මේ අනුව 1,5,8 අංක වලට හිමි ස්වර ගැනීමෙන්

| | | | | | |
|---|---|---|---|---|---|
| ස | - | C Major කෝඩ් ලෙස | C | F | G |
| | | | ස | ග | ප |
| ම | - | F Major කෝඩ් ලෙස | F | A | C |
| | | | ම | ධ | ස |

ස්වර ලැබේ. ආරම්භක ස්වරයේ (මුල්) නමින් chord එක නම් කෙරේ.

<u>පැවරුම</u>

මේ අනුව ශුද්ධ ස්වර සජනකය යොදා ගනිමින් Major කෝඩ් ගොඩ නගන්න.